# ශ්‍රී ලංකාවේ අලි ඇතුන් පිළිබඳ ඓතිහාසික සාධක
# (අනුරාධපුර යුගය අවසානය දක්වා)

**ධම්මිකා කුමාරි මනතුංග ***

ලෝකයේ දැනට ගොඩබිම ආශ්‍රිතව ජීවත්වන ක්ෂීරපායී සත්ත්ව කොට්ඨාශ අතරින් විශාලතම සත්ත්වයා වන්නේ අලියා ය. ආසියානු, අප්‍රිකානු යනාදී වශයෙන් ඔවුන් අතර විවිධ වර්ග දක්නට ලැබෙන අතර දළ සහිත වන්නන් ඇතුන් ලෙස හඳුන්වනු ලැබේ. ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව ද අලි ඇතුන් සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලා තිබේ. රජුගේ චතුරංගනී සේනාවට අයත් වූ එක් සේනාංකයක් වූයේ ඇත් සේනාංකයයි. බොහෝවිට රජුගේ ප්‍රධාන වාහනය ලෙස භාවිත වූයේ ද ඇතෙකි. අන්තර් ජාතික වෙළෙඳාමේ දී ඉතා වැදගත් තැනක් අලි ඇතුන් වෙනුවෙන් හිමි වූ අතර, රාජකීය උත්සව, සාම්ප්‍රදායික හා වෙනත් උත්සවයන්හිදී ද මොවුන්ගේ දායකත්වය ලබාගෙන තිබේ. අලි ඇතුන් සම්බන්ධව දැඩි අවධානයක් අතීතයේ පටන්ම පැවති බැවින් ඔවුන් අල්ලා ගැනීම, හීලෑ කිරීම, පුහුණු කිරීම, යුද කටයුතු සඳහා සූදානම් කිරීම හා වෙද හෙදකම් කිරීම පිළිබඳව වෙනම ශිල්ප ශ්‍රේණියක් පවත්වාගෙන ගිය බව පෙනේ. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ මෙකී ශ්‍රේණිය හස්ති කාර්යයන් ලෙස ද එහි ප්‍රධානියා හස්ති අධ්‍යක්ෂ ලෙස නම් කර තිබේ.

මෙම අධ්‍යයනයේදී අවධානය යොමුවූයේ අනුරාධපුර යුගය තුළ අලි ඇතුන් භාවිතය කෙසේ සිදුවී ද? කුමන කාර්යයභාරයක් සඳහා ඔවුන් යෙදවූයේ ද? යන්න පිළිබඳව පවතින ඓතිහාසික තොරතුරු කවරේ ද? යන්න විමසා බැලීමයි. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස පුස්තකාල අධ්‍යයනය යොදාගත් අතර, අදාළ යුගය හා සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රය උපයෝගී කරගනු ලැබිනි.

ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ අලි ඇතුන් භාවිතය පිළිබඳ තොරතුරු දක්නට ලැබෙන අතර, රාජකීය පරිහරණය, යුද කටයුතු සත්ත්ව පාලනය, වෙළෙඳාම හා වෙනත් කාර්යන්හිත් ඔවුන් වැදගත් කාර්ය භාරයක් ඉටුකළ බව පෙනී යයි.

**මුඛ්‍ය පද : අලි ඇතුන්, චතුරංගනී සේනාව, හස්ති කාර්යාංශ, වෙළෙඳාම**

---

*** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**